# අලවතුර ගනේගොඩ පුරාණ රජ මහා විහාරස්ථානයේ කාලනිර්ණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

කේ.ඒ.එස්.එස්. ධර්මරත්න

පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය,කැලණිය විශ්වවිද්‍යාලය
sandalankashashi000gmail.com

**මුඛ්‍ය පද -** අලවතුර ගනේගොඩ රජ මහා විහාරය, කාලනිර්ණය, පුරාවිද්‍යාව, වළගම්බා රජු, සාක්ෂ්‍ය

**හැඳින්වීම**

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ඓතිහාසික පුරාණ සිද්ධස්ථාන ආශ්‍රය කරගනිමින් ගොඩනැගෙන ඉතිහාස ප්‍රවෘත්තියෙහි පවතින හිඩැස් සම්පූර්ණ කරනු වස් තිබෙන ඓතිහාසික පුරාණ විහාරස්ථානවලින් ලැබෙන්නේ නොමඳ දායකත්වයකි. ශ්‍රී ලාංකේය ඉතිහාස අනන්‍යතාවය පිළිබඳව සාක්ෂ්‍ය සම්පිණ්ඩණය කළ හැකි පුරාණ විහාරස්ථානයක් වශයෙන් අලවතුර ගනේගොඩ පුරාණ රජ මහා විහාරය පෙන්වා දිය හැකි ය. මෙකී විහාරස්ථානය බුලත්කොහුපිටිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ අලවතුර ප්‍රදේශයේ ගණේගොඩ ගම්මානයට යාබදව පිහිටා තිබේ. ගණේගොඩ රජ මහා විහාරය පිළිබඳව අධ්‍යයනය කරන කල්හි එහි ආරම්භක කාලය පිළබඳව ලබන්නේ මතභේදාත්මක තත්ත්වයකි. ප්‍රධාන වශයෙන් මේ විහාරස්ථානය පිළිබඳ ජනප්‍රවාදමය සාක්ෂිය වන්නේ මෙහි ආරම්භය වළගම්බා රාජ සමයේ සිදු වූ බවයි. නමුත් සද්ධර්මරත්නාකරය ග්‍රන්ථය ඉඳුරාම වෙනස් වූ මතයක එල්බ සිටියි. තවත් ශාස්ත්‍රීය මූලාශ්‍රයවල දැක්වෙන අදහස් පරස්පර විරෝධී වේ. එබැවින් මෙම විහාරස්ථානයේ ආරම්භය පිළිබඳ නිශ්චිත මතයක් නොතිබීම මෙහි ගැටලුව වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම ගැටලුව පාදක කරගනිමින් මෙම පර්යේෂණය සිදුකෙරේ. එමෙන්ම එච්. සී. පී බෙල් හා සෙනරත් පරණවිතානගේ අදහස් ද මෙහිලා දැක්විය හැක්කේ ඉඳුරාම වෙනස් ආකාරයකිනි. එම නිසා මෙහි එන ජනප්‍රවාදයන්හි ලිඛිත සාහිත්‍යය මූලාශ්‍රයාගත තොරතුරුවල දක්වා ඇති කාලපරාසයන් සාක්ෂි සහිතව විමර්ශනය කර නිශ්චිත නිගමනයකට එළඹීම මෙහි ප්‍රමුඛ අරමුණයි. වළගම්බා රජු හා මෙම විහාරස්ථානය අතර සම්බන්ධය පිළිබඳව තොරතුරු අනාවරණය කිරීම ද මෙහිලා ඉදිරිපත් කල හැකි වන අරමුණකි. මෙකී අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ජනප්‍රවාද හා ලිඛිත සාක්ෂිවල දැක්වෙන කරුණු සලකා බලා ඒවා පුරාවිද්‍යාත්මක නටබුන් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමෙන් කාලය පිළිබඳ නිශ්චිත අවබෝධයකට පැමිණීම මෙම පර්යේෂණය ක්‍රියාත්මක වන ආකාරය වශයෙන් පෙන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ වැදගත්කම වශයෙන් පෙන්වා දිය හැක්කේ ලංකාවේ අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීමේදී පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත විහාරස්ථානයක් ලෙස ඉස්මතු කිරීමට ඇති හැකියාවයි. එමෙන්ම වළගම්බා රජු දවස තොරතුරු රැසක් අනාවරණය වීම මෙහි තවත් වැදගත්කමක් ලෙස පෙන්වා දිය හැකිය.

**ක්‍රමවේදය**

අලවතුර ගණේගොඩ පුරාණ රජමහා විහාරය පිළිබඳව තොරතුරු ඒකරාශී කරගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් මහාවංසය හා සද්ධර්මරත්නාකරය භාවිත කරනු ලැබේ. එයින් ලැබෙන සාක්ෂි විමර්ශනය කරනු ලැබේ. එමෙන්ම ඊට අමතරව කෑගලු විත්ති, කෑගලු වාර්තාව හා සබරගමු වංශ කතාව යන මූලාශ්‍රය දත්ත වෙන වෙනම පරීක්ෂා කරන අතර ඒවායේ පවතින සත්‍ය අසත්‍යතාවය පිළිබඳව පුරාවිද්‍යාත්මක සාක්ෂි නිරීක්ෂණය කරමින් නිගමනයකට එළඹීම මෙහි ප්‍රධාන ක්‍රමවේදය වශයෙන් පෙන්වා දිය හැකි ය. එමෙන්ම මෙහි දී මෙම විහාරස්ථානය පිළිබඳ විද්වත් අදහස් ද සම්මුඛ සාකච්ඡා ආශ්‍රයෙන් ලබාගන්නා අතර ජනප්‍රවාද මඟින් ඉදිරිපත් කරන කරුණු ද මෙම පර්යේෂණය සඳහා භාවිත කෙරේ. මෙකී ක්‍රමයන්ගෙන් විස්තර වන කරුණු පද්ධති ඉදිරිපත් කරමින් එම අදහස් පිළිබඳ

විමර්ශනාත්මක ලිඛිත ගොනුවක් සම්පිණ්ඩණය කිරීම මෙම පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

අලවතුර ගණේගොඩ පුරාණ විහාරය වනාහි ජනප්‍රවාද තුළින් උකහාගත හැකිවන්නේ වළගම්බා රාජ්‍ය කාලය තුළ උපන්නක් බවයි. එනම් ක්‍රි.පූ. 103-77 දක්වා කාලය වට්ටගාමිණී අභය හෙවත් වළගම්බා රජු රාජ්‍ය වැළඳූ බව මහාවංස ගත තොරතුරුවලින් ප්‍රදානිතය. එනම් මෙහි උපත අනුරාධපුරයට අයත් බව ජනප්‍රවාද ගත තොරතුරුවලින් අවධාරණය වන සත්‍යතාවකි. මෙහි නිරවද්‍ය බව පිළිබඳව සලකන විට විහාරය දෙස බැලූ බැල්මට එය එතරම් ඉපැරණි යුගයක උපන් බව කිව හැකි ය. නමුත් ඒවායෙහි පවතින කැටයම් හා චිත්‍ර කොරවක්ගල් ආදියෙන් නිරූපිත රූප මාලාව කිසිදු ආකාරයකින් අනුරාධපුර යුගය හා නෑකම් නොකියන වග ඉදිරිපත් කරන්නේ එච්. සී. පී. බෙල් කෑගලු වාර්තාවට සපයන තොරතුරු පාදක කරගනිමිනි. එහි පැවසෙන පරිදි මෙය රුකුල් දෙනු ලබන්නේ දකුණු ඉන්දීය ආභාසයටය. එබැවින් මෙය අනුරාධපුර යුගයේ දී සිදු වූ බව පැවසීමට පක්ෂ විපක්ෂ මතිමතාන්තර දැක්වෙන බව මෙසේ විශ්ලේෂණාත්මකව දැක්විය හැකි ය. නමුත් සද්ධර්මරත්නාකරය සඳහන් කරන්නේ මෙම පුරාණ විහාරය සීලවංස ධර්ම කීර්ති නම් හිමි නමක් විසින් ඉදි කරන ලද බවයි. එහි සඳහන් වන්නේ ඉන්දියාවේ ධාන්‍යකටක නම් විහාරයක් ද ලංකාවේ අලවතුර ප්‍රදේශයේ විහාරයක් ද ඉදිකරන ලද බවයි. මෙම කියන ලද ධාන්‍යකටක විහාරය ද අද ඉන්දියාවේ ශේෂ වී පවතින බව පුරාවිද්‍යාත්මක සාක්ෂි අනුව අනාවරණය වේ. එමෙන්ම මෙම අලවතුර පුරාණ විහාරයේ ද කාල සීමාව එකම කාල සීමාව බව තවදුරටත් තහවුරු කළ යුතු නොවේ. එකී ධාන්‍යකටක විහාරය පිළිබඳව තොරතුරු අධීක්ෂණය කරන විට එය කාලචක්‍ර ස්තූප අතරින් ප්‍රධාන හා පැරණි විහාරයක් බව පෙන්වා දිය හැකි වෙයි. එමෙන්ම එය පිහිටා ඇති ප්‍රදේශය වන ඉන්දියාවේ ගුන්තූර් ප්‍රදේශය පිළිබඳව අවධානය යොමු කරන විට එම පෙදෙස ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 12 දක්වා කාලය සමෘද්ධිමත්ව පැවති බව මූලාශ්‍රගත තොරතුරුවලින් පැහැදිලි වෙයි. එබැවින් ඉන් තහවුරු වන්නේ මෙම ස්තූපයේ ආරම්භය එකී රාජ්‍යය සමයට අයත් වන බවයි. ක්‍රි.පූ. 3 ආසන්න කාලසීමාවක දී ශ්‍රී ලංකාවේ රජ කරන ලද රජු වශයෙන් හඳුනාගත හැකි වන්නේ දේවානම්පියතිස්ස රජු යැයි නිර්ණය කළ හැකි ය. එය ඒ.වී. සුරවීරගේ ශ්‍රී මහා බෝධි පුරාවෘත්තයෙන් සඳහන් හෙළි වේ. එමෙන්ම ක්‍රි.ව. 12 ක සීමාව පොළොන්නරුව යුගය දක්වා දිවෙයි. එබැවින් මෙයින් නිගමනය කළ හැකි වන්නේ මෙම අලවතුර විහාරය ගොඩනැගී ඇත්තේ ද මෙකී කාල පරාසය තුළ බව නිශ්චය වශයෙන් කිව හැකිය. නමුත් එච්. සී. පී බෙල්ගේ පුරාවිද්‍යාත්මක නිරීක්ෂණයන්ගෙන් ඔහු ඉදිරිපත් කරන්නේ එහි ඇති කැටයම් දකුණු ඉන්දීය අභාසය දරන ලද බවකි. එහි ඇති කුළුණු බඳවල්වල ඇති කැටයම් හා කොරවක්ගල ආදිය තුළ ඇති ලක්ෂණ ඉන්දීය ආභාෂය ඇති බව පෙන්වා දී ඇත. ශ්‍රී ලංකාවට ඉන්දියානු ආභාසය ලැබුණු අවස්ථා ප්‍රධාන වශයෙන් දෙකකි. එනම් නුවර යුගය හා පොළොන්නරු යුගය යන අවස්ථා දෙකයි. කෙසේ නමුත් පූර්වයෙන් සඳහන් කරන ලද සාක්ෂි මතින් නිගමනය කළ හැකි වන්නේ මෙම විහාරයේ ආරම්භය ක්‍රි.පූ. 3 - ක්‍රි.ව. 12 කාලයට අයත් කාලයේ දී නිසැකයෙන්ම උපන් බවත් මෙරටට පැමිණෙන සංස්කෘතික සම්ප්‍රේෂණය වැළඳ ගනිමින් මෙය නුවර හා පොළොන්නරු යුගවල පෝෂණය වූ බවයි.

**ආශ්‍රිත මූලාශ්‍රය**

ලියනගමගේ ඒ, සහ ගුණවර්ධන ආර්. (1961) ***අනුරධපුර යුගය***, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලීය මුද්‍රණාලය

***මහාවංශය සංස්කරණය සිංහල.*** (2003) දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ශාස්ත්‍රී එන්. (1986) ***දකුණු ඉන්දියා ඉතිහාසය***, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය